## ඇස්. මහින්ද හිමියන් නිදහස උදෙසා ලියූ පද්‍යවල අඩංගු වාර්ගික ලක්ෂණ

අමරසිරි වික්‍රමරත්න

එස්. මහින්ද හිමියෝ සිංහල ජාතිකයන්ගේ වීර චරිතයක් බවට පත් ව සිටිති. අධිරාජ්‍යවාදයට එරෙහිව කවි ලිවීම මේ ගරු සැලකිලි ලැබීමට හේතුවයි. උන්වහන්සේගේ නිදහස ගැන කතා කරන නිදහස් දෑහැන, නිදහසේ මන්ත්‍රය සහ ලංකා මාතා යන මේවායෙන් බොහෝමයක විරෝධාකල්ප දක්නට ලැබේ. මේ මාතෘකාවලින්ම ජාතිය හා නිදහස ගැන මහින්ද හිමියන් තුළ තිබූ අවධානය ප්‍රකට වේ. නිදහස පිළිබඳ ව සිංහලයින්ගේ උදාසීන බව ගැන මහින්ද හිමියන් නොමනාපයෙන් සිටි බව ප්‍රකට වේ. ජනතාව නිදහස දිනා ගැනීමේ සටනට පෙළඹවීම පිණිස කවි ලියූ බව ප්‍රකටව පෙනේ. ලාංකේය ජාතිය පිළිබඳව පුළුල් මතයක් උන්වහන්සේ දරා නොසිටියහ. නිදහස දිනා ගැනීමට අමතරව ජන වර්ග අතර සමගිය උදෙසා සඳහා කළ යුතු බොහෝ අරගල ද තිබුණි. මහින්ද හිමියෝ ඒවා හඳුනා නොගත් අතර ජනතාව පෙරට කැඳවීමට පමණක් ක්‍රියා කළහ.

''දුරු කරනුවට ගන තර වහල'ඳුර රැඳී
අරුණාලෝකයක් දුන් පෙරදිගින් විදී
පුරුදුව තිබෙන කාමුක මර ඇඳේ වැදී
කරුමෙක මහත! සිංහලයා තව ම නිදී

බොරුවෙන් මෙරට රවටා කන කුහක පුරෝ
හිනයන් බසට ගසමින් මරු පහර පොරෝ
උපතින් ලද සිහල නම් ඇති සොහෝ යුරෝ
නඟමින් විජය රණහඬ පෙරමුණට වරෝ

වල් කම් කුහක කම් රටටම බෙදා දෙන
පැල්ලම් ගැහුණු සිරිතැති මුන් බදා ගෙන
මල්වැල් පළඳවා මුලසුන පුදා ලන
බොල් දිවයිනක් මෙය මිස නැත මෙදා වෙන ''[1]

''දික්කළ කෙණෙහි සතුරන්ගේ ගෙල නො සිඳ
වක් නූ පොරණ සිංහල අත් යුවල අ ද
ඔක්කෝටම වඳින බල බලා ඉ ඳ
ලක්මව හඬන හැටි උඹටත් පෙනෙනව ද

ඉපදුණ රටට අදහන ආගමට සෙ ට
මොන මොන අන්දමින් මුත් මෙහෙයක් නො කො ට
පැටවුණ බරක් මෙන් ලංකා පොළොව පි ට
පසුවන එක හොඳද? සිංහල පුතකු හ ට''[2]

සිංහලයා නිදහස උදෙසා පොළඹවනු ලබන්නේ චෝදනා ස්වරයෙනි. ජාතියේ අඩුපාඩු පෙන්වීම, පුරාණ වීරත්වයන් මතු කොට ලංකා පොළොවට බරක්

---

[1]මහින්ද හිමි, ඇස්., නිදහසේ දෑහැන, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන.1978. පි. 5

[2]මහින්ද හිමි, ඇස්., නිදහසේ දෑහැන, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන.1978. පි. 4

වී සිටීම පිළිබඳ සිංහලයා ප්‍රශ්න කරයි. සිංහලයා පමණක් අවදි කරවීම කෙරෙහි අනෙක් ජනයා සැකයෙන් බැලීම නොවැළැක්විය හැක්කකි.

විසිවන සියවසේ මුල් භාගය තුළ රටේ පාලනයට හවුල් වූවෝ අධිරාජ්‍ය ගැත්තෝය. ඔවුන් සේවය කළේ යටත්විජිතවාදයේ උවමනා එපාකම් අනුවය. ඔවුන් දෙස බලා ඉඳීම නිදහස වෙත යන ගමනට බාධාවකි. 'අපි අපිම' කියා මහින්ද හිමියන් අදහස් කළේ කුමක්ද? මෙසේ සංශයක් හට ගන්නේ දිගින් දිගටම සිංහල ජාතිය පමණක් ආමන්ත්‍රණය කරන බැවිණි.

''ලොක්කන් යයි කියන මේ කාමුක හැත්ත
දුක් මිස අපට සැප නො යොදන බව ඇත්ත
නැත්තට නැති වුණත් නොබලා ඒ පැත්ත
එක්වෙමු අපි අපිම කරනට කළ යුත්ත ''[3]

මහින්ද හිමියන් කිසියම් ආවේගයකින් කවි ලියන බව පෙනේ. මේ ආවේගය හඳුනාගත යුතුය. කවියාට අවශ්‍ය සංවරය පවත්වා ගැනීමට මේ කාලයේ දී ඉඩ ලැබී නැත. මහින්දහිමියන් උත්තේජනය ලබන්නේ බෞද්ධකම තුළිනි. සිංහලයෝ බෞද්ධයෝ වූහ. එම නිසා ඔවුන් අමතා කවි ලියූහ. නමුත් උන්වහන්සේගේ කවියේ මාතෘකාව 'නිදහස' වන විට අමතන කණ්ඩායම ගැන පරීක්ෂාකාරී වන්නට තිබුණි. ඉහත කවියේ අපි අපිම යන්නෝ කවරහු ද? සිංහලයෝ පමණක් සීමා තුළට කැඳවා තිබේ.

''රබ්බඩ වන් පුහු නම්බු ලැබීමෙහි කැදරකම මිස අය්යෝ
ගැබ්ව ඇතොත් හරි ජාතික ආලය හිත්වල මුන්නැහෙලා ගේ
ඉබ්බට ලොම් ඇත හාවට අං ඇත ඊටම එක් කොට කීවො ත්
ලෙබ්බෙගෙ මස් පිහියේ ලියවී ඇත සත් කරුණා ද මෛ ත්‍රී ''[4]

පාලකයාගේ හිතේ ජාතික ආලයක් ඇතොත් එය සමාන වන්නේ ඉබ්බාගේ ලොම්වලටය. හාවාගේ අංවලටය. ලෙබ්බෙගෙ මස් පිහියෙහි සත් කරුණාවටය, මෛත්‍රියටය. මෙය පාලක පන්තිය නිර්දය විවේචනයට ලක් කිරීමක් පමණක් නොවේ. වර්ගවාදය ද කරළියට කැඳවීමකි. ලෙබ්බෙලාට අපහාස වෙතත් ඔවුන්ගේ සංස්කෘතිය තුළ සත්ත්ව ඝාතනය පාපයක් නොවේ. ලාංකේය සංස්කෘතිය හඳුනා ගැනීමට හෝ පුද්ගල බද්ධ දෘෂ්ටි කවියට නොකැඳවා සිටීමටවත් උන්වහන්සේ උනන්දු වූ බවක් නොපෙනේ.

''භේද සුළං සැඩ ජාතික ආලෙහි රුක් මුල් මුත් සොලවන්නා
භාදකමක් අඟවාම විදේසිකයා ගිනි දැල් මොලවන්නා
පාදවමින් නැණ මීට වහා පිළියම් නොකළොත් අප කාට ත්
වේද කුමක්? විමසව් අද සිංහලුනේ නොනිඳා මරනින්දේ ''[5]

මහින්ද හිමියන් සිංහලයින් පමණක් අමතනු පෙනේ. නිදහස සිංහලයින් සඳහා පමණක්ද? ලාංකිකයෝ සමගි විය යුත්තෝය. වාර්ගික කථා තවදුටත් වලංගු නොවේ. මහින්ද හිමියෝ දේශප්‍රේමියෙකු ලෙස පෙනී සිටිති. එහෙත් වර්ගවාදය නිසා උන්වහන්සේ දූර්වර්ණ වනු පෙනේ.

---

[3]එම. පි. 8

[4]මහින්ද හිමි, ඇස්., ලංකා මාතා, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන. 1981. පි. 11
[5]එම. 1981. පි.13

කලිසම්, බැනියම් ආදී ඇඳුම් දේශීය ඒවා නොවේ. විදේශයකින් අපට උවමනා දේ එවනු ඇතැයි බලාපොරොත්තුවීම විහිළුවකි. පරසිරිත් වැළඳ ගැනීමට සිදුවන්නේ පරගැති වීම නිසාය. මෙහි ජාතිය ලෙස හඳුන්වන්නේ සිංහලයන්ද?

''සාදු සිරිත් සිය දේසෙ ඇතත් කැත වානරයන්ගෙ විලාසෙ න්
මූදු තෙරින් එන නීච භයංකර සංකර වූ හැම දේව ල්
සාදු නදින් පිළිගත්තු නිසා වුණු ජාතික හානිය අය් යෝ
මීදුමකින් කඳු සේ අප ආරිය සෑම සිරිත් යටපත් වී ''[6]

විදේශවලින් ආ හැමදේම නීච, භයංකර වූ බව සිතන්නේ ඒවා දේශයට ආගන්තුක නිසාය. අලුතින් එන දේ පිළිගැනීමෙන් වැළලී යන්නේ 'ආරිය' සිරිත්ය. ආර්ය සිරිත් ලංකාවේ වාසය කරන සැමටම වලංගු නොවේ. කවි හිමියන්ගේ නිමවුම් සිංහල වාර්ගික අඩංගුවෙන් වෙන් වන්නේ නැත.

''වන්නි හතේ වැදිලත් අර ඉංග්‍රිසියෙන්ම කතාව කරන් නේ
ගොන්කම ඒ මදිවාට තවත් සිය බාසෙ ගැනයි මතුරන් නේ
ඉන්නෙ හිටින්නෙ හිතන්නෙ කියන්නෙ ද අන්තිම හුස්ම හෙළන් නේ
දූන් බැරිනම් මතුවත් මම ඉංග්‍රිසියෙක් වෙමි යයි පතමින් නේ ''[7]

මේ ආත්මයේ දී නොහැකි වූ ඉංග්‍රීසියකු වීමේ සිහිනයෙන් සිංහලයෝ මිය යති. පරගැති ඔවුහු පරසිරිත් ගරු කරති. ජාතික හැඟීම් උද්දීපනය කිරීම සඳහා ලියූ කවි වාර්ගික ස්වරූපයක් උසුලයි. මහින්ද හිමියන් සිංහලයින් පමණක් ආමන්ත්‍රණය කිරීම මෙයට හේතුවයි. දේශයේ නිදහස සඳහා අධිරාජ්‍යවාදය බිඳ දැමීමට සියලු දෙනාම කැඳවිය යුතුව තිබුණි.

මෙරටට ආ විදේශීය ආක්‍රමණිකයෝ සිංහල සේනාවන් හමුවේ පරාද වූහ. බියගුළුකම සිංහලයාට තරම් නොවේ. අවසානයේ ලාංකිකයෝ විදේශිකයන් හමුවේ පරාජය වූහ. ජාතිය අවදි කිරීමට අවශ්‍යව ඇති මොහෙතක පරාජයන් හුවා දැක්වීමෙන් ප්‍රයෝජනයක් නැත. තත්කාලීන සටන්වලට වෙනත් ජනවර්ග සම්බන්ධ වූයේ නැත. එවක ඔවුහු කරලියේ නොසිටියහ. නමුත් මහින්ද හිමියන් ලියන වකවානුව එය නොවේ. ජනවර්ග තුනක් ප්‍රමුඛව දක්නට ලැබුණු යුගයකි. කවියේ ආමන්ත්‍රණය ලඝුවීම මධ්‍යස්ථ සිංහලයාගේ පවා ආතතිය ඉහළ නංවන කරුණක් වනු ඇත.

''උඩින් අහස් කුසත් - යටින් සුළං ලොවත්
මෙදෑ තුරේ දිනූ - උතුම් වූ ජාතියක්
සිංහලුන් මිසක් - කව්ද ලෝකයේ
සිතව් බලව් සොයව් - ඇතොත් තවත් කියව්''[8]

සිංහලයෝ උතුම්ය. එවන් ජාතියක් යටත්ව සිටීම සුදුසු නැත. සැබෑ බොදුනුවෝ සියළු සත්ත්වයන්ට ආදරය කළ යුත්තෝය. නමුත් මෙහි මිනිසුන් අතරින් සිංහලයින් පමණක් සංකෝචනය කොට තෝරා ගෙන තිබේ.

---

[6]මහින්ද හිමි, ඇස්., ලංකා මාතා, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන. 1981. පි. 9

[7]එම. පි. 6

[8]මහින්ද හිමි, ඇස්., අප්‍රකට මිහිඳු රචනා, සිටි යන්ත්‍රණාලය, පානදුර. 1953. පි. 35

''සුරන් කෙරේ ඇතොත්-ගුණයි කියා යමක්
පුරාණ සිංහලුන්-ගේ ගතී වෙතී''[9]

සිංහලයා පමණක් උතුම් යයි සිතීම මහින්ද හිමියන් අත් හරින්නේම නැත. දෙවියන්ගේ ගති ඇත්තේ සිංහලුන්ටය.

''බලව් පොලොන්නරු අනුරාපුර පෙදෙ ස
සිතව් පැවැති නිදහස මෙහි පෙරදව ස
නගව් තව තවත් තර සර තරුණ ගො ස
වරෙව් යමවු නැඟිටිව් නොපියව් දෙ ඇ ස

උපන්නෙත් මැරෙන්නෙත් තනිවමයි ලො වේ
එයින් පිටස්තර වෙන විදියකින් නො වේ
අනුන් පිහිට තකමින් යුතුකම හමු වේ
බියෙන් මුලු වදිනු අපහට තරම් නො වේ''[10]

මහින්ද හිමියන්ගේ කවිවල බලහත්කාරයක් ඇත. ජනතාව තමන්ට අවශ්‍ය ලෙස මෙහෙයවීම කවි හිමියන් ප්‍රිය කරන සෙයකි. තනියෙන් ඉපදුන සේම තනියෙන් මිය යා යුතුය. මෙය සත්‍යයකි. නමුත් උපන්නේ මහින්ද හිමියන් කියන පරමාර්ථය සඳහා නොවේ. උපන් දේශය වෙනුවෙන් සේවය කළ යුතු බව සත්‍යයකි. නමුත් ඒ සඳහා ජාතිය යන සංකල්පය දිගින් දිගට පාවිච්චි කිරීමෙන් ජාතීන් අතර නොතිබුණ ප්‍රශ්න ඇතිවීම නොවැළැක්විය හැකිය. ජාතීන් කීපයක් අතරින් එකක් වෙසෙස් කොට සැලකීම ජාතිවාදයට උත්තේජක සැපයීමකි

සඳත් සදිසි පෙම්බර ලක් මවුනි සෙ ට
'මමත් ඔබගෙ පුත් පැටියෙකි' කියන්න ට
ඇතොත් නියත ජාතික වූ බසක් මට
තවත් නොමැත සැනසිල්ලක් මෙ මිහි පිට[11]

මහින්ද හිමියන් දක්වන පුතා ඕනෑම ජාතිකයෙක් වන්නට පුළුවන. උපන් රටේ නියම පුතෙක් වන්නේ එම බස වහරන්නටත් අගය කරන්නටත් හැකි නම් පමණි. 'ජාතික බස' කුමක්ද? මෙය 'ස්ව බස' වූයේ නම් යෙහෙකි. නිදහස උතුම් දෙයකි. සියලු ආකාරවලින් නිදහස ලැබීම ඊටත් උතුම්ය. මහින්ද හිමියන් නිදස්වීමට පුත්‍රයවන්ත වී නැත. ආගම හෝ ජාතිය හේතුවෙන් තව කෙනෙක් ගැන වෛරයක් ඇති කරන සාධකයක් නොවිය යුතුය.

මහින්ද හිමියන් ලියුවේ, කියුවේ සිංහල භාෂාව ලියන, කියන ජනතාව සඳහාය. එම නිසා උන්වහන්සේගේ ආමන්ත්‍රණය සීමා විය. සිංහල කතා කරන ජනයා සඳහා ලිවීමේ වරදක් නැතත් අන්‍ය ජාතීන් ලඝු නොකරන ආස්ථානයක් ලබා ගත්තේ නම් මැනවි.

''එක විදියටයි ලොව කවුරුත් උපන් නේ
එකෙකුට මොකද වැඩි කොටසක් බෙදන් නේ
මෙකරුණ හොඳින් පිරිසිඳ දැන නොගන් නේ
මක බෑ වෙලාදෝ! හිස් මොළ මොවුන් නේ[12]

[9]එම. පි. 57

[10]මහින්ද හිමි, ඇස්., නිදහසේ මන්ත්‍රය, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන. 1963. පි. 3

[11]මහින්ද හිමි, ඇස්., අප්‍රකට මිහිඳු රචනා, සිටි යන්ත්‍රණාලය, පානදුර. 1953. පි. 92

සමාජයේ ඇති අසමාන කම් ඉවත් විය යුතු බව මහින්ද හිමියෝ කල්පනා කරති. සියලු භේද ඉවත් වූ පසු නියම නිදහසත් සාමයත් උදාවේ. නිදහස අධිරාජ්‍යවාදයෙන් මිදීමට සීමා නොවේ.

උස් තැන් කපා ඇද මිටි තැන් පිර වීම
උස් මිටි දෙකම වඳ කොට සම කරලී ම
උස් මනුදමකි! ගතියකි! යන පැවසී ම
උස් හඬ නඟා පතුරවි! සැම තැන දී ම ''[13]

මහින්ද හිමියන්ගේ සෑම කාව්‍යයකම පාහේ බුද්ධාගම ගැන කියැවේ. උන්වහන්සේ බෞද්ධ භික්ෂුවක් හෙයින් එහි අරුමයක් නැත. විදේශීය ජන්මයක් සහිත උන්වහන්සේ සිංහල ජාතිය හා දේශය ගැන මෙතරම් භක්තියක් ගොඩනගා ගත්තේ ලංකා ද්වීපය බුද්ධාගම හා බැඳී තිබුණ නිසා බව නිගමනය කළ හැක. 'කුසුමාඤ්ජලී', 'රත්නමාලි කාව්‍යය', 'අංගී රස ගායනා I හා II', ආදි විශාල පද්‍ය සංඛ්‍යාවක් බුදු ගුණ ප්‍රධාන කොට ධම්ම හා සංඝ ගුණ දැක්වීම උදෙසා රචනා කොට තිබේ. ජාතික හැඟීම් පුබුදුවා ජනතාව තුළ වාත්සල්‍යය ඇති කිරීම මහින්ද හිමියන්ගේ අභිප්‍රාය වූ බව පෙනේ. ඒ වෙනුවෙන් කැපවී ක්‍රියා කළහ. දේශපාන ඥාණයේ පැවති අඩුපාඩු කම් නිසා උන්වහන්සේගේ යෙදවුමේ වටිනාකම හීන වී ගොස් තිබේ.

[12]මහින්ද හිමි, ඇස්., නිදහසේ දෑහැන, පී. කේ. ඩබ්. සිරිවර්ධන, මරදාන.1978. පි. 7

[13]එම, පි. 3